# 9 ශුද්ධ වූ පේදුරු තුමා

## ශුද්ධ වූ පේදුරු තුමාගේ කැඳවීම. (ලුක් 5:1-11)



9.1 රූපය - ශුද්ධ වූ පේදුරු තුමා

දිනක් ජේසුස් වහන්සේ ගෙනෙසරෙත් විල අසල, පේදුරු තුමාගේ ඔරුවට නැගී සෙනඟට දහම් පණිවුඩය දේශනා කළ සේක. එය නිම වූ පසු මුහුදට ගොස් දැල හෙළන්නැයි ඔවුන් වහන්සේ පේදුරු තුමාට වදාළ සේක. පෙර දින රාත්‍රියේ මසුන් ඇල්ලීමට බෙහෙවින් වෙහෙස වුණු ඔහුට එක ම මාළුවකුවත් අල්ලා ගැනීමට නොහැකි වූ බව ජේසුස් වහන්සේට පැවසූ ඔහු, "එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි"යි පවසමින් ඔවුන් වහන්සේගේ අණට කීකරු විය. ඔරුවේ සිටි පේදුරු තුමා හා ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ තුමා පුදුමයට පත් කරමින් මසුන් රාශියක් අල්ලා ගත හැකි විය. අවට තිබූ ඔරුවට ද කථා කර ඔවුන්ගේ උපකාරය ඇතිව එම මසුන් ඔරුවට පුරවා ගත්හ. මසුන් හසු වී විස්මිත ව සිටි ඒ අවස්ථාවේ දී පේදුරු තුමා ජේසුස් වහන්සේ අබියස දණින් වැටී ඔහුගේ පව්කාර බව පිළිගත්තේ ය. "බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැ"යි පවසමින් ජේසුස් වහන්සේ ඒ මොහොතේ දී ම තමා අනුගාමී වන්නට පේදුරු තුමාට ආරාධනා කළ සේක. ඔහු සියල්ල අත හැර, ඔවුන් වහන්සේ අනුගාමී විය. පේදුරු තුමාගේ සොයුරු ඇන්ඩෘ ද තවත් සොහොයුරන් දෙදෙනකු වූ සෙබදිගේ පුතුන් වන ජොහන් හා ජාකොබ් ද ඔවුන් වහන්සේ අනුගාමී වූහ.

## පේදුරු තුමාගේ මහා ප්‍රකාශය (මතෙව් 16:13-16)

පිලිප්පි කයිසාරිය නම් පෙදෙසට ගිය අවස්ථාවක දී ජේසුස් වහන්සේ, "මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිසුන් කියත් දැ"යි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසූ සේක. ඔවුහු විවිධ පිළිතුරු දුන්හ. ඉන්පසු ඔවුන් වහන්සේ, "ඔබ මා කවරකු කියා කියන්නාහු දැ"යි ඔවුන්ගෙන් ඇසීය. ජේසුස් වහන්සේගේ ප්‍රශ්නයට එඩිතර ව පිළිතුරු දුන් පේදුරු තුමා "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ"යි ප්‍රකාශ කළේ ය. එවිට ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ජෝනාගේ පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්ත ය. මන්ද, ස්වර්ගයෙහි වැඩවසන මාගේ පියාණන් වහන්සේ විසින් මිස මනුෂ්‍ය මගකින් මෙය ඔබට එළිදරව් නොකරන ලද්දේ ය. මම ඔබට කියමි. ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. මරණයේ බලයට වුව ද එය පරාජය කළ නොහැකි ය. ස්වර්ග රාජ්‍යයේ යතුර ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දීත් බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය.

(ශු. මතෙව් 16:17-19)

ජේසුස් වහන්සේ, "ඔබ ඉතා භාග්‍යවන්ත ය" යි පවසන ලද්දේ පේදුරු තුමාට ය. "සීමොන්" යන නාමය වෙනුවට "පර්වතය" යන අර්ථය ඇති 'පේදුරු' යන්න දෙන ලදී. ශුද්ධ වූ සභාවේ අත්තිවාරම මේ පර්වතය ය. එනම් පේදුරු තුමා ය. එසේම "ස්වර්ගයෙහි යතුර" බාර දෙන ලද්දේ ද පේදුරු තුමාට ය. බලයලත් තැනැත්තා යතුර හිමිකාරයා ය. බැඳීමට ද මිදීමට ද විශේෂ බලය පේදුරු තුමාට හිමි විණි. ඒ අනුව පව් කමා කිරීමටත් විශ්වාසය හා සදාචාරය පිළිබඳ ව ඉගැන්වීමටත් බලය එතුමාට හිමි වේ. මෙලෙස ජේසුස් ස්වාමීන් වහන්සේ, පේදුරු තුමා ව, ශුද්ධ වූ සභා නායකත්වයට පත් කරන ලදි.

## ජේසුස් වහන්සේ පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යභාරය (ජොහන් 21:15-19)

| ජේසුස් වහන්සේ | පේදුරු තුමා | ජේසුස් වහන්සේ |
|---|---|---|
| ජොහන්ගේ පුත්‍ර වූ සීමොන් මොවුනට වඩා ඔබ මට ප්‍රේම කරන්නෙහි ද? → | "එසේය ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක." → | "මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න." |
| ජොහන්ගේ පුත්‍ර වූ සීමොන්, ඔබ මට ප්‍රේම කරන්නෙහි ද? → | "එසේය ස්වාමිනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක." → | "මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න." |
| ජොහන්ගේ පුත්‍ර වූ සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහි ද? → | "ස්වාමීනි ඔබ සියල්ල දන්නා සේක; මා ඔබ වහන්සේට ප්‍රේම කරන බව ඔබ වහන්සේ දන්නා සේක. → | "මාගේ බැටළුවන් පෝෂණය කරන්න." |

මෙලෙස පේදුරු තුමා, ජේසුස් වහන්සේ වෙත, තම ප්‍රේමය තුන්වරක් ම ස්ථිර ලෙස ප්‍රකාශ කළේ ය. ඔවුන් වහන්සේගේ බැටළුවන්ගේ එඬේරා වෙමින් ශුද්ධ වූ සභාව නමැති බැටළු රැළ පෝෂණය කිරීමේ වගකීම එතුමාට භාර දුන් සේක. අපෝස්තුලුවරුන්ගේ නායකයා වූ පේදුරු තුමාගේ තැනට ශුද්ධෝත්තම පියතුමා පත් වේ. ශුද්ධ වූ සභාවේ දෘශ්‍යමාන නායකයා වූ එතුමා ව "ශුද්ධෝත්තම පියතුමා", "පාප් වහන්සේ" යන නම්වලින් ද හඳුන්වනු ලැබේ.

ශුද්ධ වූ පේදුරු තුමාගෙන් පසු ව අඛණ්ඩ ව එම තනතුරට ශුද්ධෝත්තම පියවරු තේරී පත් වෙති. ශුද්ධෝත්තම පියතුමා බලයෙන් ද ගෞරවයෙන් ද අන් සියලු රාජගුරු ප්‍රසාදිවරුනට වඩා උසස් වෙයි. ශුද්ධෝත්තම පියතුමකු පත් කරනු ලැබූ විට අභිනව නාමයක් ගැනීම සිරිතකි. එතුමාණන් මෙලෝ කිසි ම ලෞකික බලයකට යටත් නොවේ. කතෝලියකයන් ලෙස අපි සැම ශුද්ධ වූ කතෝලික සභාවේ නීති රීති හා සම්ප්‍රදයයන් පිළිපදිමු. ශුද්ධ වූ සභා ශ්‍රේෂ්ඨයන්ට ගරු කරමු කීකරු වෙමු.



9.2 රූපය - අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

## අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

ආර්ජන්ටිනාවේ අගනුවර වන බුවනෝර්ස් අයර්ස්හි දී ඉතාලි සංක්‍රමිකයන් වන දුම්රිය කම්කරු මාරියෝ හෝස් බර්ගෝලියෝ හා රෙජිනා මරියා යුවලට දුව 1936 දෙසැම්බර් 17වන දා පුතෙක් උපන්නේ ය.. ඔහු ජොර්ජ් මාරියෝ බර්ගෝලියෝ විය.

පාසල් අධ්‍යාපනයෙන් පසු බුවනෝර්ස් අයර්ස් විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගත්තේ ය. 1958 මාර්තු 11වන දා ජේසු නිකායට බැඳී දර්ශනය හා දේව ධර්මය හදාරා 1969 දෙසැම්බර් 13වන දින පූජකවරය ලැබී ය. පසු ව දේව ධර්මය පිළිබඳ මහාචාර්යවරයකු ලෙස සේවය කළේ ය.

ජන්මයෙන් ලබා තිබූ නායකත්ව ගුණාංග හේතුවෙන් 1973 දී ආර්ජන්ටිනාවේ ජේසු නිකායික ප්‍රාදේශාධිපති තනතුරට පත්



නොමිලේ බෙදහැරීම සඳහා ය.

ව 1979 දක්වා එම තනතුරෙහි කටයුතු කර, 1980-1986 දක්වා ශුද්ධ වූ මිගෙල් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ලෙස තම වගකීම් නිසි ලෙස ඉටු කළේ ය. 1992 සහායක රදගුරුතුමකු ලෙස ද 1998 බුවනෝර්ස් අයර්ස්හි අගරදගුරු තුමා ලෙස ද පත් විය. එතුමාණන් 2001 පෙබරවාරි 21වන දින ශු. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමන් විසින් කාදිනල් තනතුරට ඔසවන ලදි. එම ධුරය යටතේ වගකීම් රාශියක් දරූ එතුමා සමාජ සාධාරණය උදෙසා ඇපකැප වෙමින් සරල හා චාම් ජීවිතයක් ගත කළේ ය. 1982 සිට ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇති මෙතුමා ආගමික කරුණු විෂයයේ පමණක් නොව සමාජ, ආර්ථික, දේශපාලනික ගැටලු සම්බන්ධයෙන් ද අභීත ව සිය මත ප්‍රකාශ කළේ ය. මෙතුමාණන් 2013 මාර්තු මස 13වන දින ශුද්ධ වූ කතෝලික සභාවේ 266 වන ශුද්ධෝත්තම පියාණන් ලෙස තෝරා පත් කරනු ලැබිණි.

## ක්‍රියාකාරකම

1. ශුද්ධ වූ සභාවේ නායකත්වයට පේදුරු තුමන් පත් කරනු ලැබූ ස්ථානය නම් කරන්න.
2. "පේදුරු" යන්නෙහි අර්ථය ලියන්න.
3. පේදුරු තුමාගේ "මහා ප්‍රකාශය" උපුටා දක්වන්න.
4. ජේසුස් ස්වාමීන් වහන්සේ විසින් පේදුරු තුමාව "භාග්‍යවන්තයෙක්" බව ප්‍රකාශ කිරීමට හේතුව ලියන්න.
5. "එඬේරා" හා "බැටළු රැළ" යන යෙදුම්වල අරුත් ලියන්න.

*ජීවිතය සඳහා*

*මිනිසුන් ඔබේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස, ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළවන්න.*